## කසළ කළමනාකරණය ඔබගේ ව්‍යාපාරයට වැදගත් වන්නේ ඇයි?

අවිධිමත් කසළ කළමනාකරණය, සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව සතු ප්‍රතිරූපයට අහිතකර ලෙස බලපාන අතර, මෙරට ප්‍රධානතම ආකර්ෂණ වන වන-සතුන්ට සහ ස්වභාවික සම්පත්වලට එමගින් හානි පැමිණේ.

එම ස්ථානයේදීම කසළ කළමනාකරණය කිරීම, පසුව එය කළමනාකරණය කිරීමට වඩා පිරිවැය- අඩු වේ. කසළ එක් රැස් වූ පසුව ඒවා කළමනාකරණය කිරීම සඳහා ව්‍යාපාර වෙනමම ආයෝජනය කළ යුතුය.

ඵලදායී කසළ කළමනාකරණය, පාරිභෝගික අපේක්ෂා සහ ජාතික කසළ රෙගුලාසි සමග ඔබගේ ව්‍යාපාරය අනුවර්ථනය කරයි.

මහා පරිමාණ සමාගම් බොහෝ විට තම හවුල්කරුවන් හට වගකීම්සහගත කසළ කළමනාකරණය සහ බැහැර කිරීම ඇතුළු පාරිසරික කළමනාකරණ පද්ධතියක් (EMS) තිබේද යන්න පිළිබඳ සැලකිලිමත් වේ.

## ඔබගේ කසළ කළමනාකරණය කිරීම සඳහා ඔබට ගත හැකි දිගුකාලීන ක්‍රියාමාර්ග

- 5R සංකල්පය පුරුදු වන්න - ප්‍රතික්ෂේප කරන්න, අවම කරන්න, යළි භාවිත කරන්න, ප්‍රතිචක්‍රීයකරණය කරන්න, ප්‍රතිඅරමුණු කරන්න.
- කසළ නිසි ලෙස හැසිරවීම සහ බැහැර කිරීම සඳහා අවශ්‍ය විසඳුම් ගොඩනැගීම සඳහා ඔබගේ ප්‍රදේශයේ බලධාරීන් සහ ප්‍රජාව සමග කටයුතු කරන්න.
- ආහාර අපද්‍රව්‍ය අවම කිරීම සඳහා අවම පංගු ආකාරයේ ආහාර ලැයිස්තුවක් පවත්වාගෙන යන්න. ප්‍රදේශය අවටින් සපයා ගන්නා අමුද්‍රව්‍යවලින් ආහාර සකස් කරන්න.
- කසළ නිෂ්පාදනය ගණනය කිරීමටත්, සටහන් තබා ගැනීමටත් කටයුතු කරන්න. ප්‍රතිචක්‍රීයකරණය, බැහැර කිරීම සහ යළි භාවිතය සඳහා යොමු වන ප්‍රමාණ සටහන්කර ගන්න.
- ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි දෑ පහසුවෙන් බැහැර කිරීම සඳහා, පාරිභෝගිකයින්ටත්, කාර්යමණ්ඩල සාමාජිකයින්ටත් ප්‍රතිචක්‍රීයකරණ බඳුන් ලබා දෙන්න.
- අනවශ්‍ය ඇසුරුම්කරණයෙන් බැහැර වන්න.

**ආගන්තුක සත්කාර කර්මාන්තයේ ආහාර කලින් සකසා තිබීම, සමස්ත ආහාර පිරිවැය අපතේ යාමෙන් 20% කට ආසන්න ප්‍රමාණයකට වග කියයි. ආහාර නරක් වීම, අධි නිෂ්පාදනය සහ මුළුතැන්ගේ අතපසු වීම් ආදී සාධක හේතුවෙන් මෙම අපතේයාම සිදු වේ.**

### වැඩිදුර කියවීම්

ශ්‍රී ලංකාවේ කසළ එකතුකරන්නන් සහ ප්‍රතිචක්‍රීයකරණය කරන්නන්

බලපත්‍රලාභී ඉලෙක්ට්‍රොනික කසළ එකතු කරන්නන්

කසළ කළමනාකරණය සහ අවම කිරීම: වාණිජ ගොඩනැගිලි සඳහා මාර්ගෝපදේශයක්

**ඔබ නොවේ නම්, කවුද? අදම 👉 ක්‍රියා කරන්න 🌳 තිරසාර ලෙස සිතන්න 🌎**

USAID Indo-Pacific Opportunity Project (IPOP)
International Development Group LLC

56/6A Horton Place
Colombo 7, Sri Lanka
Tel: 94-112697052

USAID
FROM THE AMERICAN PEOPLE

# කසළ කළමනාකරණය කිරීම සඳහා ඔබට කළ හැකි දේ



USAID
FROM THE AMERICAN PEOPLE

# අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට ඔබට කළ හැකි දේ

1. හොඳ අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් සඳහා සේවකයන්ගේ සහ අමුත්තන්ගේ දායකත්වය ලබාගන්න

2. ඔබේ ගෙවත්තට අවශ්‍යය කාබනික පොහොර නිපදවීමට කොම්පෝස්ට් බඳුනක් භාවිතා කරන්න

3. මුද්‍රණය හැකිතාක් දුරට අඩු කරන්න. මුද්‍රණය කළ යුතුම නම් කඩදාසියේ දෙපැත්තම මුද්‍රණය කිරීමට උනන්දු වන්න. නව කාට්රිජ් මිලදී ගැනීම වෙනුවට කාට්රිජ් තුළට තීන්ත නැවත පුරවන්න

4. ඔබේ බෑග් සහ ඇසුරුම් හැකි සෑමවිටම නැවත භාවිතා කරන්න

5. එක් වරක් පමණක් භාවිතා කළ හැකි භාණ්ඩ වෙනුවට නැවත භාවිතා කළ හැකි හෝ ස්වභාවිකව දිරාපත් කළ හැකි විකල්ප භාණ්ඩ සෑමවිටම තෝරාගන්න උනන්දු වන්න

6. ඔබේ සැපයුම් දාමය තිරසාර කරන්න. දේශීය සහ නැවත භාවිතා කළ හැකි නිෂ්පාදන හැකි සෑම විටම මිලදී ගන්න

7. කඩදාසි, කාඩ්බෝඩ්, වීදුරු, පිසින තෙල්, ටින් සහ විද්‍යුත් අපද්‍රව්‍ය වැනි ප්‍රතිචක්‍රීකරණය කළ හැකිදේ සුදුසු ප්‍රතිචක්‍රීකරණ පහසුකම් ඇති මධ්‍යස්ථාන වෙත යවන්න




ප්ලාස්ටික් ජල බෝතල් භාවිතය ඉවත් කිරීමෙන් පසු, ශ්‍රී ලංකාවේ ත්‍රාසජනක අත්දැකීම් සපයන කුඩා සංචාරක ව්‍යාපාරයක් මගින් ප්ලාස්ටික් බෝතල් 35,000 ක් පමණ පරිසරයට මුදා හැරීම වළක්වාගෙන ඇත.මෙය මසකට ප්ලාස්ටික් බෝතල් 145 කට සමාන වේ.

“අපගේ කාබනික අපද්‍රව්‍ය ඌරු කොටුවක් වෙත යොමු කිරීමෙන් අපද්‍රව්‍ය අවම කර තිරසාරභාවයට දායක වීමට අපි තීරණයක් ගෙන ඇත්තෙමු. මෙමගින් අපද්‍රව්‍ය කළමනාකරණය අපට පහසුවනවා පමණක් නොව, එය ප්‍රතිලාභදායක ප්‍රයත්නයක් ද වේ.”

~ ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාන සංචාරක ව්‍යාපාරකරුවෙක්